# සීතාවකපුර නගර සභාව
# 2026 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

පහත සඳහන් භාණ්ඩ හා සේවාවන් ලබා ගැනීම සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත් 2025.12.31 දින ප.ව. 3.00 දක්වා භාරගනු ලැබේ.(www.seethawakapura.uc.gov.lk) වෙබ් අඩවියේ සඳහන් ආදර්ශ අයදුම්පත හෝ තමා විසින් පිළියෙල කර ගත් අයදුම්පතක් මේ සඳහා ඉදිරිපත් කළ යුතුය. මෙම සියලුම අයදුම්පත් ලියාපදිංචි ගාස්තුව රු.2500.00 ක් (අයදුම්පත්‍රයට ඇතුළුව) වන අතර අයදුම්පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය හැකිය. ලේකම්, සීතාවකපුර නගර සභාව, අවිස්සාවේල්ල යන නමින් චෙක් පත් ප්‍රේෂණ එවිය යුතුය. නැතහොත් අවිස්සාවේල්ල මහජන බැංකුවේ ගි.අ. 029100190288966 ට බැර කර තැන්පත් කුවිතාන්සිය සමඟ අයදුම්පත්‍රය එවීමට පුළුවන. එසේම කාර්යාල වේලාවන් තුළ (09.00 පැයේ සිට 15.00 පැය දක්වා) මුදලින් ගෙවීම් කල හැකිය. ලියාපදිංචි අයදුම්පත බහාලු ලිපි කවරයේ වම්පස කෙළවරේ " සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2026" යනුවෙන් සඳහන් කළ යුතුය.

| භාණ්ඩ සැපයීම | වැඩ හා සේවා සැපයීම |
|---|---|
| 1. කාර්යාල ගෘහ උපකරණ (වානේ, දැව, ප්ලාස්ටික්) | 34. නාම පුවරු, දැන්වීම් පුවරු, බැනර් සකස් කිරීම. |
| 2. කාර්යාලීය ලිපි ද්‍රව්‍ය හා උපකරණ. | 35. ගොඩනැගිලි ඉදිකිරීම් සහ නඩත්තු සේවා කොන්ත්‍රාත් රුපියල් ලක්ෂ 5 ට අඩු. |
| 3. සනීපාරක්ෂක ද්‍රව්‍ය හා උපකරණ(කොසු,ඉදල්,ගම් බූට්ස්,අත් ආවරණ,මුඛ ආවරණ,විෂබීජ නාශක දියර) | 36. ගොඩනැගිලි ඉදිකිරීම් සහ නඩත්තු සේවා කොන්ත්‍රාත් රුපියල් ලක්ෂ 5 ට වැඩි |
| 4. මාර්ග ඉදිකිරීම් ද්‍රව්‍ය | 37. මාර්ග, පාලම්, බෝක්කු, කාණු ඉදිකිරීම සහ නඩත්තු සේවා කොන්ත්‍රාත් රුපියල් ලක්ෂ 5 ට අඩු. |
| 5. ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය | 38. මාර්ග, පාලම්, බෝක්කු, කාණු ඉදිකිරීම සහ නඩත්තු සේවා කොන්ත්‍රාත් රුපියල් ලක්ෂ 5 ට වැඩි |
| 6. ජලනල උපාංග, | 39. වඩු වැඩ |
| 7. හියුම් පයිප්ප හා කොන්ක්‍රීට් නිශ්පාදන. | 40. පෙදරේරු වැඩ |
| 8. කාර්යාල කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර උපකරණ | 41. වැල්ඩින් වැඩ |
| 9. ඡායා පිටපත් යන්ත්‍ර, ඩුප්ලෝ යන්ත්‍ර සහ මුද්‍රණ යන්ත්‍ර සඳහා අවශ්‍ය තීන්ත හා ටෝනර් | 42. ජලනල කාර්මික සේවා |
| 10. වාහන උපාංග හා අමතර කොටස්(ටයර්,ටියුබ්,රිම්ටේප්, බැටරි හා අමතර කොටස්) | 43. අභ්‍යන්තර දුරකථන සේවා. |
| 11. විදුලි පහන් නඩත්තුව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ | 44. බර යන්ත්‍ර හා රථ වාහන කුලියට සැපයීම සහ ප්‍රවාහන සේවා සැපයීම ( බොරළු ප්‍රවාහනය. ) |
| 12. කසළ අපහරණ කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ | 45. වාහන අළුත්වැඩියා කටයුතු |
| 13. සංග්‍රහ කටයුතු සඳහා අවශ්‍ය ආහාර පාන. | 46. වාහන සර්විස් කිරීම |
| 14. උද්‍යාන අලංකරණය සඳහා උපකරණ | 47. ශබ්ද විකාශන, උත්සව භාණ්ඩ කුලියට සැපයීම. |
| 15. ළමා උද්‍යාන සඳහා ක්‍රීඩා උපකරණ සහ ක්‍රීඩා භාණ්ඩ. | 48. නීතිඥ සේවා හා මිනින්දෝරු සේවා සැපයීම, භාෂා පරිවර්තන සේවා සැපයීම. |
| 16. පානීය ජල බෝතල් සැපයීම. | 49. ජල මෝටර් අළුත්වැඩියාව. |
| 17. කර්මාන්ත උපකරණ (ගල් ,වැලි,පස්,සිමෙන්ති) | 50. රසායනාගාර සේවා |
| 18. තාර කෝලාස් සැපයීම. | 51. නළ ළිං ඉදිකිරීම. |
| 19. ඖෂධ හා වෛද්‍ය උපකරණ. | 52. ආරක්ෂක සේවා සැපයීම. |
| 20. ඉන්ධන , එල්.පී ගෑස් හා ලිහිසි තෙල් | 53. ගස් කැපීම හා බැදීමේ සේවා සැපයීම. |
| 21. තිර රෙදි, රෙදි කොඩි සහ නිල ඇඳුම් | 54. වායු සමීකරණ, ශීතකරණ සේවා සැපයීම |
| 22. ශබ්ද විකාශන උපකරණ. | 55. ටයර් රී බිල්ඩ් කිරීමේ සේවාව සැපයීම |
| 23. පාසල් ළමුන්ට ත්‍යාග සඳහා අවශ්‍ය උපකරණ | |
| 24. මුද්‍රණ සේවා හා මුද්‍රා සකස් කිරීම | |
| 25. ශිලා ඵලක හා සිහිවටන සැපයීම | |
| 26. හට් වර්ග සැපයීම (කැනපි හට්) | |
| 27. වීදුරු හා වීදුරු භාණ්ඩ සැපයීම. | |
| 28. පොලිතින් උර හා පොහොර උර සැපයීම. | |
| 29. කාර්යාලීය යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියාව | |
| 30. කෘමිනාශක ,වල්නාශක හා පොහොර | |
| 31. තීන්ත වර්ග ඇතුළු හාඩ්වෙයාර් අයිතම | |
| 32. පෙර පාසල් උපකරණ | |
| 33. නිල හැඳුනුම්පත් සැකසීම. | |

**කොන්දේසි**

1. ලියාපදිංචි වූ අයගෙන් මිළ ගණන් කැඳවා අදාළ සැපයුම් සේවා හා වැඩ ඉටු කර ගැනීමට සාමාන්‍යයෙන් ක්‍රියාකරන අතර අවශ්‍ය වූ විට ඉන් පරිබාහිරවද කටයුතු කිරීමේ අයිතිය නගර සභාව සතුය.
2. මිළ ගණන් සාමාන්‍යයෙන් මාස 06 ක කාලයක් තුළ වෙනස් නොකර ස්ථාවරව තැබිය යුතුය.
3. භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත් සැපයීමේදී රජයේ අනුමත බදු වර්ග / කොන්දේසිවලට හා සභාවේ නීතිවලට යටත් විය යුතුය.
4. භාණ්ඩ හා සේවා සපයා ගැනීමේදී අදාල භාණ්ඩය හෝ සේවාව සපයාගනු ලබන්නේ කාගෙන්ද යන්න නිශ්චය කිරීම , ඇගයීම් කමිටුවේ නිර්දේශ මත ටෙන්ඩර් කමිටුව හා සභාව විසින් අවස්ථානෝචිත පරිදි තීරණය කරනු ඇත.
5. සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කර ගැනීමෙන් සභාවට සපයා ගත යුතු සේවාවන් ඔවුන්ගෙන්ම පමණක්ම ලබාගත යුතුය යනුවෙන් යන අයිතිවාසිකමක් ඔවුන්ට නොවිය යුතුය.
6. සැපයුම්කරුවන් දින 60ක් හෝ ඊට වැඩි කාලසීමාවක් සඳහා ණය පහසුකම් ලබාදිය හැකි විය යුතුයි.
7. කොන්ත්‍රාත්කරුවන් CIDA හි ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් විය යුතුයි.

**නිර්ණායක**

1. නිසි පරිදි මිළ ගණන් ඉදිරිපත් කිරීමට සහ කලට වේලාවට භාණ්ඩ සැපයීමට අපොහොසත් වන හා ඇණවුමේ සඳහන් විස්තර හා ආදර්ශයට අනුකූලව මනා තත්ත්වයෙන් යුතු භාණ්ඩ සැපයීම පැහැර හරිනු ලබන සැපයුම්කරුවන්ගේ නම ලියාපදිංචි ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.
2. වාහන හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් මීට පෙර රාජ්‍ය ආයතනවලට සේවා සපයා පළපුරුදු ආයතනය ක් වීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.
3. වගකීම් කාලයක් ඇති භාණ්ඩ හා සේවා සඳහා වගකීම් කාලය සඳහන් කර තිබීම.
4. ඇණවුමට අදාළ සියලුම ද්‍රව්‍ය නගර සභාවේ ප්‍රධාන ගබඩාවට භාර දිය යුතුය.
5. ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය නගර සභා භූමියට ප්‍රවාහනය කර සැපයිය යුතුය.

**ලියා පදිංචි වීම සඳහා ඉදිරිපත් කළ යුතු ලියවිලි**

1. සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් ලෙස ලියාපදිංචි වීම සඳහා එක් එක් සේවය වෙනුවෙන් වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
2. එකම සැපයුම්කරුවකු/ කොන්ත්‍රාත්කරුවකු සේවාවන් එකකට වඩා වැඩි සේවා ගණනක් ලියා පදිංචිය අවශ්‍ය වන්නේ නම් එක් එක් සේවා සම්බන්ධයෙන් ලියාපදිංචි වීමේ අයදුම්පත්‍ර ගාස්තු ගෙවිය යුතුය.
3. සංස්ථාවක් නම් සංස්ථාවක් ලෙස නීතිගත කළ බවට දෙන සහතිකය
4. තනි පුද්ගල ව්‍යාපාරයක් නම් ලියාපදිංචි කිරීමේ සහතිකය
5. සමාගමක් නම් සමාගම පනත අනුව ලියාපදිංචි කිරීමේ සහතිකය
6. VAT අයකරන ආයතනයක් නම් VAT ලියාපදිංචි කිරීමේ සහතිකය

වැඩි විස්තර සඳහා අපගේ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න(www.seethawakapura.uc.gov.lk) කාර්යාල වේලාවන් තුළදී පැමිණ හෝ පහත දුරකථන අංක ඇමතීමෙන් ද ලබාගත හැක.

කේ.ඩී.සුනිල් ජයරත්න,
සභාපති,
සීතාවකපුර නගර සභාව ,
අවිස්සාවේල්ල,

දුරකථන අංක - 036-2222285
ඊ මේල් ලිපිනය - seethawakapurauc@gmail.com